# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2049/14 - 2017 දෙසැම්බර් මස 12 වැනි අඟහරුවාදා - 2017.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 04**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1887/21 හා 2014.11.05 දිනැති, අංක 1905/07 හා 2015.03.09 දිනැති සහ අංක 2006/53 හා 2017.02.17 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත, අංක 1836/6 හා 2013.11.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 20.1, 20.1.1 සහ 20.1.2 වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

20.1 අන්තර්කාලය 2006.01.01 වැනි දින සිට 2017.12.31 වැනි දින දක්වා බල පැවැත්වේ. එම කාලය තුළ පහත සුදුසුකම් සහ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ගේ උසස්වීම් පහත සඳහන් පරිදි සිදු කළ යුතුය.

20.1.1 සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම.

(I) 2008.01.01 වැනි දිනට පෙර සේවයට බැඳී III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධාරියෙකු, අංක 509/7 හා 1988.06.07 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* හා ඊට අදාල සංශෝධන මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, සේවයේ II පංතියේ II ශ්‍රේණියේ සිට II පංතියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරා තිබිය යුතු සියලු සුදුසුකම් සහ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්කාලය තුළදී II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

20.1.2 සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම

(I) 2008.01.01 වන දිනට පෙර සේවයට බැඳී II ශ්‍රේණියට අන්තර්ග්‍රහණ වූ හෝ අන්තර්කාලය තුළ දී II ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන් අන්තර්කාලය තුළදී පහත සඳහන් සුදුසුකම් සහ අවශ්‍යතා සැම අතින්ම සම්පූර්ණ කරනු ලබන්නේ නම්, එම දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(අ) පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබීම ;
(ආ) පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය නොවී තිබීම ;
(ඇ) II ශ්‍රේණියට උසස් වූ දින සිට වරලත් ඉංජිනේරු තත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබීම.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඒ. කුලතුංග,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

12 - 918


1A - G 26768 – 19 (2017/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*